**අපි වෙනුවෙන් අපි අරමුදල - 2022**

**----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

අපි වෙනුවෙන් අපි අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

### 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

#### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නිවාස ව්‍යාපෘති ඉදිකිරීම් කටයුතු සඳහා වර්ෂ 2014 සිට 2017 දක්වා කාල පරිච්ඡේදය තුළ අරමුදල විසින් මිලදීගෙන තිබුණු එහෙත් 2022 දෙසැම්බර් 31 වනවිටත් භාවිතා නොකළ පිරිවැය රු. 1,076,549 ක් වූ යාන්ත්‍රික අත් මෙවලම් (Hand Drill, Angle Grinders) ඒකක 72 ක් නිෂ්පාදිත ඇසුරුම්වල පැවති අතර 2022 දෙසැම්බර් 31 දිනට මෙම උපකරණවල ප්‍රත්‍යාගණිත අගය රු. 419,600 ක් හා එහි වාර්ෂික ක්ෂය රු.49,700 ලෙස ගිණුම්ගතකර තිබුණි. රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07(43) ප්‍රකාරව මෙම වත්කම් වල සාධාරණ අගය පිලිබඳ ඇගයීමක් රහිතව ප්‍රත්‍යාගණනයන් සිදුකර ඇති බැවින් වත්කම්වල ධාරණ අගය ගිණුම්වලින් නිරූපනය නොවුණි. | යන්ත්‍රෝපකරණයන්හි වටිනාකම ප්‍රත්‍යාගණනය කිරීම මණ්ඩලයක් මගින් සිදුකරනු ලබන අතර, මෙම යන්ත්‍රෝපකරණ සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශයද නියෝජනය වන පරිදි මණ්ඩලයක් පත්කර විධිමත් සමීක්ෂණයක් සිදුකිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලබන බවත් ඒ අනුව ගිණුම් වලින් පෙන්විය යුතු සාධාරණ අගය නිසි පරිදි නිරූපණය කිරීමට කටයුතු කරන බවත් සඳහන් කරමි. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07(43) ප්‍රකාරව වත්කම්වල ධාරණ අගය ගිණුම්වලින් නිරූපණය කළයුතුය. |

#### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අරමුදල විසින් නිවාස ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා 2010 සිට 2020 දක්වා වර්ෂයන්හිදි මිලදීගෙන තිබුණු පිරිවැය රු.1,071,546 ක්වූ පිත්තල සරනේරු, නිවාස විදුලි රැහැන් යෙදීමේ උපාංග ඇතුළු ඉදිකිරීම් ද්‍රව්‍යය ගබඩාගතව ඇතත් එම තොග වටිනාකම හඳුනාගෙන ගිණුම්ගතකර නොතිබුණි. මෙම ද්‍රව්‍ය පිරිවැය මිලදීගත් වර්ෂයේ වියදමක් ලෙස සලකා ගිණුම්ගත කර ඇතත් 2022 දෙසැම්බර් 31 දින වනවිටත් භාවිතාකර නොතිබුණු බැවින් 2022 දෙසැම්බර් 31 දිනට පැවති ජංගම වත්කම් හා සමුච්චිත අරමුදල රු. 1,071,546 ක් බැගින් අඩුවෙන් දක්වා තිබුණි. | මෙම ඉදිකිරීම් ද්‍රව්‍ය පිලිබඳව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට 4 වන ඉංජිනේරු සේවා රෙජිමේන්තුව විසින් උපදෙස් අපේක්ෂා කර ඇති අතර එම තොග 2022/2023 වසරෙහි පූර්ණ නිවාස ව්‍යාපෘතියෙහි ප්‍රතිලාභීන්ගේ නිවාස ඉදිකිරීම සඳහා භාවිතා කිරීමට හෝ භාවිතයට ගත නොහැකි නම් අයෝග්‍ය කිරීම් පිළිබඳව උපදෙස් ලබාදීමට නියමිතය. තොග වටිනාකම් ගිණුම්ගත කර ජ'නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | වත්කම් නිසිපරිදි ගිණුම් මගින් අනාවරණය කළ යුතුය. |
| (ආ) | 2021 වර්ෂයේ උපචිත වියදමක් ලෙස හඳුනාගෙන නොතිබූ 2021 වර්ෂයට අදාල රු. 266,002 ක ව්‍යාපෘති වියදමක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණු | විගණනය විසින් පෙන්වා දී ඇති පරිදි ජ'නල් සටහනක් මගින් නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ගිණුම් වාර්තා තුලින් නිවැරදි තොරතුරු අනාවරණය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අතර එය සමුච්චිත අරමුදලට හර කිරීම වෙනුවට උපචිත වියදම් ගිණුමට හර කර තිබුණි. ඒ අනුව 2022 දෙසැම්බර් 31 දිනට පැවති උපචිත වියදම රු. 266,002 ක් අඩුවෙන්ද සමුච්චිත අරමුදල එම ප්‍රමාණයෙන් වැඩියෙන්ද දක්වා තිබුණි. | | |
| (ඇ) | රණජයපුර නිවාස සංකීර්ණයේ නිවාස අළුත්වැඩියා කටයුතු සිදුකිරීම සඳහා රු.1,230,951 ක් නාවික හමුදාවේ “අපි වෙනුවෙන් අපි අරමුදල නමින්වූ ගිණුමකට” මුදාහැර ඇතත් එවැනි අළුත්වැඩියාවක් සමාලෝචිත වර්ෂයේදී සිදුකර නොතිබුණි. ඉදිරි වියදම් දැරීම සඳහා වෙනත් ආයතන වෙත ලබාදෙන මුදල්, අත්තිකාරම් ලෙස සලකා ගිණුම්ගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස සලකා ගිණුම්ගතකර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අළුත්වැඩියා වියදම රු.1,230,951ක් වැඩියෙන් හා ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | නිවාස පරිහරණයේදී සිදුවන අලාභහානි ඇස්තමේන්තු කර අළුත්වැඩියා කටයුතු නාවික හමුදාවට පැවරීමට කළමනාකරණ මණ්ඩල අනුමැතිය ලැබී ඇත.<br>අලුත්වැඩියා කටයුතු කඩිනමින් සිදුකරන ලෙස නාවික හමුදාව දැනුවත් කර ඇති අතර, අලුත්වැඩියා කටයුතු නිසි පරිදි සිදු නොකරන්නේ නම් අදාළ අරමුදල් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | ඉදිරි වියදම් දැරීම සඳහා ලබාදෙන මුදල් අත්තිකාරම් ලෙස ගිණුම්ගත කළ යුතු අතර, අළුත්වැඩියාවියදම් දැරීමෙන් අනතුරුව තථ්‍ය වියදම ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | රණජයපුර නිවාස 13 ක් වෙනුවෙන් 2022 ජනවාරි 01 දිනට හිඟහිට පැවති රු.1,168,000ක වාරික මුදල් සමාලෝචිත වර්ෂය තුළ අයකරගෙන නොතිබුණු නමුත් 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු වාරික වටිනාකමට ඇතුලත්ව නොතිබුණි. තවද, එම නිවාස හිමියන්ගෙන් තිදෙනෙකු වර්ෂයතුළ නිවාස ආපසු භාරදී ඇතත් ඔවුන්ගෙන් 2021 දෙසැම්බර් 31 දිනට අයවියයුතු රු. 64,000 ක හිඟ වාරික අයකරගෙන නොතිබුණි. | හමුදා විනයට පටහැනිව ක්‍රියාකරන ලද අයවළුන් බන්ධනාගාරගත කිරීම ආදිය හේතුවෙන් අතහැර ඇති නිවාස පවරා ගෙන වෙනත් හමුදා සාමාජිකයන් වෙත ලබාදී ඇති බැවින් ඔවුන් තවදුරටත් ලේඛනගත කර හිඟ වාරික ලෙස පෙන්වීම තුලින් රණජයපුර හිඟ වාරික මුදල් ඉතා විශාල ලෙස වැඩිවන බැවින් ඔවුන් ලේඛන වලින් ඉවත් කර ඇත. ඒ සඳහා කළමනාකරණ මණ්ඩල අනුමැතිය මත රණජයපුර නිවාසලාභී නාම ලේඛනයෙන් ඉවත් කිරීමට කටයුතු යොදා ඇත.<br>තවද නිවාස භාර දෙන ලද සාමාජිකයින් විශාල ප්‍රමාණයක් හිඟ වාරික මුදල් ගෙවීමට අපහසු බවත් ඔවුන් වෙත ලබාදීමට නියමිත 2/3 ක මුදලින් හිඟ වාරික අයකරගන්නා ලෙස විශාල පිරිසක් ඉල්ලුම් කිරීම හේතුවෙන් එලෙස හිඟ මුදල් අයකර ගැනීමේ ක්‍රමවේදය නතර කිරීමට කටයුතු කරන ලදි. | ගිවිසුම් ගත පරිදි වාරික අයකර ගැනීමෙන් හිඟ වාරික අවමකර ගත යුතුය. |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | අර්ධ හා පූර්ණ නිවාස ප්‍රතිලාභීන් වෙත වාරික ගෙවීම. | 128,128,652 | ප්‍රතිලාභ මුදල් අදාල ප්‍රතිලාභින් 339දෙනෙකු වෙත ලැබුණු බවට සනාථ වන ලියවිලි. | අදාල සනාථ කිරීම් ඒ ඒ හමුදාවන් වෙතින් සහ අදාළ ප්‍රතිලාභීන් වෙතින් ගෙන්වාගනු ලබන අතර, තවදුරටත් ලැබිය යුතු වාර්තා පවතින අතර, එම වාර්තා ලද විගස ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | ගෙවනු ලබන මුදල් නියමිත දින අදාල ප්‍රතිලාභීන් වෙත ලැබුණු බවට තහවුරු කර ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කල යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට රණජයපුර නිවාසහිමියන්ගෙන් අයවියයුතු හිඟ වාරික මුදල් රු. 42,968,024 ක් වූ අතර වසර දෙකකට වඩා වැඩිකාලයක් හිඟහිටි ශේෂයන්ගේ එකතුව රු. 12,525,000 ක් විය. | විශ්‍රාම ගන්නා නිවාස ලාභීන්ගේ විශ්‍රාම වැටුප සැකසීමට කාලයක් ගතවීම, නිවාඩු නොමැතිව රාජකාරියට වාර්තා නොකිරීම, සේවය හැර යාම, මිය යෑම හා බන්ධනාගාර ගත වීම ආදී හේතු නිසා වැටුප් නතර වන බැවින් දීර්ඝ කාලීන හිඟ මුදල් පවතී.<br>එවැනි අවස්ථාවලදී සම්පූර්ණ හිඟ මුදල එකවර වැටුපෙන් අයකළ නොහැකි බැවින් මේ පිළිබඳ සොයා බැලීම හා ඉදිරියේදී හිඟය මඟහරවා ගැනීම සඳහා මණ්ඩලයක් පත් කිරීමට හා මණ්ඩලයේ නිර්දේශ අනුව ඉදිරි කටයුතු කරනු ලැබේ. | ගිවිසුම් ප්‍රකාරව හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු සම්ප්‍රේෂණ කුළුණු ආදායම රු.37,098,064 ක් වූ අතර ගිවිසුම් අනුව පූර්ව මාසයට අදාල කුලී මුදල ඊළඟ මාසය තුළ ගෙවිය යුතු වුවද, රු.3,624,589 ක අයවිය යුතු කුලී මාස 03කට අධික කාලයක් හිඟ හිට තිබුණි. | 2022.12.31 වනවිට ලැබිය යුතු මුළු කුළුණු ආදායමෙන් හිඟ වාරික අයකර ගැනීමෙන් පසු තවදුරටත් හිඟ මුදල් අයකර ගැනීමට ඇත්තේ ශ්‍රී ලංකා ටෙලිකොම් (මොබිටෙල් හුවමාරු) සමාගමේ මාස 03 ක් සඳහා රු. 3,624,589 ක් වේ. එම හිඟ හිටි කුළුණු ආදායම් අයකර ගැනීම සඳහා අදාළ සන්නිවේදන ආයතනය වෙත ලිපි මගින් දැනුවත් කර ඇති බවද වැඩිදුරටත් දන්වා සිටිමි. | ගිවිසුම් ප්‍රකාරව කුලී ආදායම් අයකර ගැනීමත් නිසි ආයෝජන සඳහා යොමුකිරීමත් සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | රණජයපුර වෙළඳ සංකීර්ණයේ 2022 දෙසැම්බර් 31 දිනට හිඟහිටි බදුකුලි ආදායම රු.297,260 ක් විය. ගිවිසුම් ප්‍රකාරව මාසික බදුකුලිය අදාල මාසය තුළ ගෙවිය යුතු වුවද පූර්ව වර්ෂයට අදාල රු.223,760 ක හිඟ මුදලක් පැවතුණි. | හිඟහිටි බදුකුලී ආදායම අයකර ගැනීම සඳහා රණජයපුර පරිපාලන කාර්යාලය වෙතින් අදාළ පුද්ගලයින් දැනුවත් කර ඇති අතර, අයකර ගැනීමට කඩිනමින් කටයුතු කරනු ලැබේ. | ගිවිසුම් ප්‍රකාරව මාසික බදුකුලිය අදාල මාසය තුළ අයකර ගත යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2008 අංක 06 දරන අපි වෙනුවෙන් අපි අරමුදල් පනතේ 09 වන වගන්තිය | අරමුදල විසින් පවත්වාගෙන යනු ලබන "අපි වෙනුවෙන් අපි අරමුදල" යන නාමයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුදලක් තිබිය යුතු අතර පනතේ 7 වන වගන්තිය යටතේ අරමුදලට ගෙවිය යුතු මුදල් එකි ගිණුමට බැර කරනු ලැබිය යුතු වුවත් අරමුදල විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුමක් පවත්වා නොතිබුණු අතර රාජ්‍ය බැංකු දෙකක ගිණුම් 04ක් හා පෞද්ගලික බැංකුවක ගිණුම් 02ක් ලෙස ජංගම ගිණුම් 06ක් පවත්වාගෙන තිබුණි. | කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය පරිදි ඉදිරියේදී ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුමක් ආරම්භ කිරීමට කටයුතු කෙරේ. | 2008 අංක 06 දරන අපි වෙනුවෙන් අපි අරමුදල් පනතේ 09 වන වගන්තිය ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 877(1)(ඇ) හා (ඈ) | අරමුදලක පාලනාධිකාරිය විසින් වාර්ෂික අයවැය ලේඛණය අරමුදලේ අරමුණට අනුකූලව පිළියෙල කර මහා භාණ්ඩාගාරයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු අතර අනුමත අයවැයකින් තොරව කිසිදු වියදමක් නොදැරිය යුතු බව අවධාරණය කර ඇතත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 2022 වර්ෂයේ අයවැය සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර නොමැත. 2023 වර්ෂයේ අයවැය ලේඛනය සඳහා භාණ්ඩාගාර අනුමැතිය ය ලැබී ඇත. 2022 හා 2023 වර්ෂවල මෙහෙයුම් කටයුතු ඒකාබද්ධව සිදුකරන බැවින් 2022 ට අදාළ අයවැය 2023 තුල අඩංගු වන බව කාරුණිකව සඳහන් කරමි. | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 877(1)(ඇ) ) හා (ඈ) ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඇ) | අංක 01/2020 හා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 877(2)(ඇ) | එක් එක් කාර්තුව අවසානයේ අරමුදලේ ප්‍රගතිය සමාලෝචනය කළ හැකි වන පරිදි අරමුදලේ ප්‍රධාන කාර්යයන් පිළිබඳ කාර්තුමය වාර්තාවක් සකස් කර කාර්තුව අවසන් වී දින 15 කට පෙර රාජ්‍ය | එක් එක් කාර්තු අවසානයේ අරමුදලේ ප්‍රගති සමාලෝචන වාර්තා ආරක්ෂක අමාත්‍යාංශයේ සැලසුම් අංශය වෙත යොමු කර ඇති අතර සංශෝධිත | අංක 01/2020 හා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 877(2)(ඇ) හා මාර්ගෝපදේශ 04 |

| | | | | |
|---|---|---|---|---|
| | හා මාර්ගෝපදේශ 04 | මුදල් දෙපාර්තමේන්තුව හා ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙතද පිටපතක් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද 2022 වර්ෂය සඳහා එම වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 877(2) (ඇ) ප්‍රකාරව කාර්තුමය වාර්තා විගණකාධිපති වෙතද ඉදිරිපත් කිරිමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඇ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 877(2)(ඇ) වගන්තිය | අරමුදල විසින් වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමග කාර්යසාධන වාර්තාවක් රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුවට පිටපතක් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන සමග කාර්ය සාධන වාර්තාව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට පිටපත් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත් කිරිමට කටයුතු කරන බව දන්වමි. | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 877(2)(ඇ) වගන්තිය ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 1.8 මුදල් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අරමුදල විසින් පවත්වාගෙන යන අරමුදල් කළමනාකරණ ඉතිරිකිරීමේ ගිණුමෙහි 2022 වර්ෂය තුල මිලියන 3 සිට මිලියන 24 දක්වා පරාසයක ශේෂයක් පවත්වාගෙන තිබුණු අතර අරමුදලේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා හඳුනාගනිමින් අතිරික්ත අරමුදල් වැඩි ප්‍රතිලාභයක් ලැබෙන කෙටිකාලීන ආයෝජනවල යෙදවීමට කටයුතු කර නොතිබුණි. | කාරක ප්‍රාග්ධන අවශ්‍යතා වෙනුවෙන් යම් මුදලක් රඳවා තබාගැනීම ඕනෑම ව්‍යාපාරයක/සංවිධානයක අවශ්‍යතාවය වන අතර, එසේ නොමැතිව එදිනෙදා මෙහෙයුම් කටයුතු ඉටුකර ගැනීම අපහසුය. නමුත් සමස්ත වශයෙන් පුරෝකථනය කල නොහැකි ව්‍යාපාරික හා සංවිධාන පරිසරයක් තුල ඇතිවිය හැකි අවිනිශ්චිතතා හේතුකොට ගෙන මූල්‍ය අතිරික්තතා/ඌණතා ඇතිවිය හැකි බැව් කාරුණිකව පෙන්වා දෙමි. | අරමුදලේ සැලසුම්කල කාර්යයන් සඳහා මුදල් අවශ්‍යතාවය පුරෝකථනය කර ඒ අනුව වියදම් සඳහා මුදල් අවශ්‍යතා සැලැස්මක් සකස්කල යුතුය. |
| (ආ) | අරමුදල විසින් මහජන පරිත්‍යාග ලබාගැනීම සඳහා පවත්වාගෙන තිබුණු ජංගම ගිණුම් 03ක 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා ලැබුණු එකතුව රු.901,898 ක පරිත්‍යාග මුදල් ශේෂයක් පවත්වාගෙන ගොස් තිබුණි. මෙම ගිණුම් මගින් එම කාලය තුල කිසිදු ගෙවීමක් සිදු වී නොතිබුණු අතර එම පරිත්‍යාග මුදල් ඵලදායී ආයෝජනයක යොදවා නොතිබුණි. | විගණනය විසින් පෙන්වා දී ඇති පරිදි මෙම ගිණුම් වල පවත්වා ගතයුතු අවම මුදල් ශේෂයන් ඉතිරිවන පරිදි මුදල් ඉවත්කර ගෙන "අපි වෙනුවෙන් අපි" අරමුදලේ ස්ථාවර තැන්පතුවක ආයෝජනය කිරීමට කටයුතු කරනු ලැබේ. | ඵලදායී අරමුදල් කළමනාකරණයක් පවත්වාගත යුතුය. |

## 1.9 ආයෝජන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අරමුදලට අයත් ජංගම ගිණුමක 2021 දෙසැම්බර් සිට 2022 සැප්තැම්බර් 15 දක්වා කාලය තුළ රු. මිලියන 2.8ක පමණ අතිරික්ත මුදල් ශේෂයක් නිශ්කාර්යව පවත්වාගෙන ගොස් තිබුණි. 2022 මැයි මාසය තුළ ආයෝජන පොලි අනුපාත ඉහලගොස් ඇතත් මෙම අතිරික්ත මුදලින් රු. මිලියන 2.5 ක් පමණක් ස්ථිර තැන්පතුවක ආයෝජනය කිරීම 2022 සැප්තැම්බර් 15 දින දක්වා ප්‍රමාද කිරීම හේතුවෙන් රු. 281,527 ක ඇස්තමේන්තුගත ආයෝජන පොලී ආදායමක් අහිමි වී තිබුණි. | ඉදිරියේදීද අවම ශේෂයක් පවත්වා ගනිමින් අතිරික්ත මුදල් ආයෝජනය කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | මූල්‍ය අවශ්‍යතාව පුරෝකථනය කර අතිරික්ත අරමුදල් ආයෝජනය සඳහා කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 398,875,766 අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 26,231,498 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 372,644,268 ක වර්ධනයක් නිරීක්ෂණය විය. 2022 වර්ෂයේ ව්‍යාපෘති සංවර්ධන වියදම සියයට 96 කින් අඩු වීම සහ පොලි අනුපාත ඉහල යාම මත ආයෝජන ආදායම සියයට 228 කින් වැඩිවීම, මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අරමුදලෙහි 2022 වර්ෂයේ කලමනාකරණ මණ්ඩල තීරණය අනුව පූර්ණ නිවාස 25 ක් සහ අර්ධ නිවාස 350 ක් සඳහා රු.මි.300ක උපරිමයකට යටත්ව නිවාස ආධාර ලබාදීමට සැලසුම්කර ඇතත් එම සැලැස්ම ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම මත 2022 හා 2023 වර්ෂ දෙකම වෙනුවෙන් පූර්ණ නිවාස 30ක් සහ අර්ධ නිවාස 400ක් සඳහා ආධාර මුදල් පිරිනැමීමට 2022 සැප්තැම්බර් 27 දින පාලක මණ්ඩලය විසින් අනුමත කර තිබුණි. කෙසේවෙතත් මෙම නිවාස ආධාර වැඩසටහන ක්‍රියාත්මක කළ යුතු කාල රාමුව, වැඩසටහන් අදියරයන් හා වගකිවයුතු නිලධාරීන් හා අපේක්ෂිත ඉලක්ක දක්වමින් විධිමත් ක්‍රියාකාරි සැලසුමක් පිළියෙලකර නොතිබුණි. | 2022 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම අනුමත කිරීම 2022 අප්‍රේල් 11 දක්වා ප්‍රමාදවිය. විගණනය විසින් ලබා දී ඇති උපදෙස් පරිදි නිවාස ආධාර වැඩසටහන ක්‍රියාත්මක කල යුතු කාල රාමුව,වැඩසටහන් අදියරයන් හා වගකිවයුතු නිලධාරීන් හා අපේක්ෂිත ඉලක්ක හෝ මේ සඳහා සුදුසුකම් ලබන පාර්ශව තෝරා ගැනීමේ ක්‍රමවේද දක්වමින් විධිමත් ක්‍රියාකාරි සැලැස්මක් ඉදිරි වර්ෂයේදි ඉදිරිපත් කරනු ලබන බව කාරුණිකව දන්වමි. | අනුමත අයවැය පාදක කරගත් විධිමත් ක්‍රියාකාරි සැලසුමක් පිළියෙලකර කාලීනව ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුල් සැලසුම අනුව 2022 වර්ෂයේදී රු. මිලියන 300 කට යටත්ව නිවාස ආධාර ලබා දීමට සැලසුම්කර ඇතත් ආරක්ෂක අමාත්‍යාංශ මහජන දිනයන්හිදී ඉදිරිපත්වූ ඉල්ලීම් අතරින් තෝරාගත් ප්‍රතිලාභීන් 11 ක් සඳහා පමණක් අර්ධ නිවාස ආධාර ලෙස රු.7,351,078 ක් සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය කාර්යසාධනය සියයට 2.3 ක් වැනි අවම මට්ටමක පැවතුණි. | 2022 සහ 2023 වර්ෂයන් එක් කර 2023 වර්ෂයේ එක් ව්‍යාපෘතියක් වෙතින් ප්‍රතිලාභ පිරිනැමීමට මෙම අරමුදල පාලනය කරනු ලබන කළමනාකරණ මණ්ඩලය මගින් උපදෙස් හා අනුමැතිය ලබා දී ඇත. | සැළසුම් කළ පරිදි ප්‍රතිලාභ ගෙවීම තුලින් අපේක්ෂිත මූල්‍ය කාර්ය සාධන මට්ටමට ලඟාකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පූර්ව වර්ෂයේදී අර්ධ නිවාස 299 ක් සහ පූර්ණ නිවාස 27 ක් සඳහා රු.මිලියන 252ක් ගෙවා අවසන් කිරීමට සැලසුම් කර ඇතත් 2022 දෙසැම්බර් 31 දිනට අර්ධ නිවාස වාරික 36 ක් හා පූර්ණ නිවාස වාරික 18 ක් වෙනුවෙන් රු.17,264,681 ක වාරික මුදල් ගෙවිය යුතුව පැවතුණි. | 2021 වර්ෂයට අදාලව සිදු කරනු ලැබූ නිවාස ව්‍යාපෘතීන් එම වර්ෂයෙහි රට තුල පැවති කොවිඩ් 19 වසංගත රෝගී තත්වය සහ ආර්ථික අර්බුධකාරී තත්ත්වය හේතුවෙන් එම වර්ෂය තුල අවසන් කිරීමට නොහැකි විය. | සැළසුම් කළ පරිදි ප්‍රතිලාභ ගෙවීම තුලින් අපේක්ෂිත මූල්‍ය හා භෞතික කාර්ය සාධන මට්ටමට ලඟාකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ගුවන් හමුදා සාමාජිකයන් සඳහා ගෙවනලද අර්ධ නිවාස වාරික මුදල් හා ඊට අදාල පරිපාලන වියදම් ලෙස ගෙවා තිබුණු රු. 32,086,845 ක් "මධ්‍යම සුභසාධක හා පුනරුත්ථාපන අරමුදල" නමින් පවත්වාගෙන යනු ලබන ගිණුමක් වෙත බැර කර තිබුණු බව නිරීක්ෂණය වේ. එම ගිණුම ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිල ගිණුමක් බවට සනාථ නොවුණු බැවින් එවැනි නිල නොවන ගිණුමකට අරමුදලේ ප්‍රතිපාදන මුදාහැරීම විගණනයේදි ගැටළු සහගත විය. | ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ප්‍රතිලාභී මුදල් "මධ්‍යම සුභසාධක හා පුනරුත්ථාපන අරමුදල" වෙත බැර කරන ලෙස අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇත. ඒ අනුව ප්‍රතිලාභ මුදල් ඉහත සඳහන් ගිණුමට බැර කර ඇත.<br>මෙම ගිණුම සම්බන්ධයෙන් ගුවන් හමුදාව වෙතින් විමසීම් කර නිල ගිණුමක් නොවන්නේනම් ඒ පිළිබඳව කළමනාකරණ මණ්ඩලයේ අවධානය යොමු කර නිල ගිණුමක් වෙත මුදල් ප්‍රේෂණය කිරීමට කටයුතු කරන බවද කාරුණිකව දැනුම් දෙමි. | රාජ්‍ය අරමුදල් සඳහා වගවන බවට පූර්ණ තහවුරුවක් සහිත ගිණුමක් වෙත මුදල් නිදහස් කිරිම නිර්දේශ කෙරේ. |

### 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට පැවති ස්ථාවර වත්කම් හා සුළු මෙවලම් රු. 3,556,299 ක් ලෙස ප්‍රත්‍යාගණනය කර තිබුණු අතර වර්ෂයට අදාල ක්ෂය රු.1,396,443 ක් ලෙස හඳුනාගෙන තිබුණි. නමුත් අරමුදල විසින් 2018 වර්ෂයේ සිට | 2018 වර්ෂයේ සිට නිවාස ඉදිකර ගැනීමට මිලදී ගන්නා ලද යුධ හමුදාව භාරයේ පවතින වත්කම් පූර්ණ නිවාස ව්‍යාපෘතිය වෙනුවෙන් යොදා ගන්නා ලෙසත්, භාවිතා කිරීමට නොහැකි | අරමුදලේ වත්කම් අරමුදලේ කාර්යයන් සඳහා උපයෝජනය කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නිවාස ඉදිකර ගැනීම සඳහා අරමුදල් ලබාදෙන බැවින් මෙම වත්කම් අරමුදලේ කාර්යයන් සඳහා ඌණ උපයෝජිතව ශ්‍රී ලංකා යුධ හමුදාව භාරයේ පැවති අතර යුධ හමුදාව විසින් ඇතැම් වත්කම් අරමුදලේ කාර්යයන් නොවන වෙනත් ආයතනවල කටයුතු සඳහා යොදවා තිබුණු අවස්ථාද නිරීක්ෂණය විය. | ඉදිකිරීම් ද්‍රව්‍ය අයෝග්‍ය කිරීම් මණ්ඩලයක් පත්කර අයෝග්‍ය කිරීමට කටයුතු කරන ලෙසත් දන්වා 4 වන ඉංජිනේරු සේවා රෙජිමේන්තුව වෙත උපදෙස් ලබා දී ඇත. | |
| (ආ) | ගැණුම් පිරිවැය රු.4,150,000 වූ ලෝඩර් බැකෝ යන්ත්‍රයක් (Skid Steer Loader) 2022 දෙසැම්බර් 31 දිනට ප්‍රත්‍යාගණන අගය රු. 985,210 ක් ලෙස ගිණුම් ගතකර ඇතත් එම වත්කම පසුගිය වර්ෂ 03 ක කාලය තුළ භාවිතා කළ පාර්ශ්ව පිලිබඳව අනාවරණය නොවූ අතර ස්ථාවර වත්කම් සමීක්ෂණ මණ්ඩලය විසින් භෞතිකව සත්‍යාපනය කර නොතිබුණු බැවින් එහි පැවැත්ම හා ආරක්ෂාව පිලිබඳව විගණනයට තහවුරු කර ගත නොහැකි විය. තවද 2019 ඔක්තෝබර් 31 දිනැති කළමනාකරණ මණ්ඩල තීරණයක් පරිදි මෙම වත්කම 4 වන ඉංජිනේරු සේවා රෙජිමේන්තුව භාරයේ පැවතියයුතු වුවද සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් එම තීරණය ක්‍රියාත්මක කර නොතිබුණි. | නාවික හමුදාව වෙත භාර දී ඇති Skid Steel Loader යන්ත්‍රය, 4 වන ඉංජිනේරු සේවා රෙජිමේන්තුව වෙත එම යන්ත්‍රයේ අවශ්‍යතාවයක් නොමැති වීම හේතුවෙන් භාර නොගැනීමට කටයුතු කර ඇත.<br>එහෙත් උක්ත ඉදිකිරීම් යන්ත්‍රය නාවික හමුදාව විසින් සිදු කරනු ලබන ඉදිකිරීම් වෙනුවෙන් යොදා ගැනීමට මෙම අමාත්‍යාංශ අනුමැතිය ඉල්ලා ඇති අතර, කළමනාකරණ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව ඇත. | වත්කම්වල පැවැත්ම හා ආරක්ෂාව තහවුරු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 877(2)(ඇ) හි සඳහන් මාර්ගෝපදේශ අංක 04 හි 6(ආ) ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන භාෂා ත්‍රිත්වයෙන් සකස්කර ඉදිරිපත් කළ යුතු වුවද 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සිංහල භාෂාවෙන් පමණක් ඉදිරිපත් කර තිබුණි. | දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ට පරිවර්තනය කිරීමට ප්‍රමාණවත් කාලවේලාවක් නොමැතිවීම හේතුවෙන් අනෙකුත් භාෂා දෙකෙන් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට නොහැකි විය. ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශන භාෂා ත්‍රිත්වයෙන් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | මුදල් රෙගුලාසි 877(2)(ඇ) හි සඳහන් මාර්ගෝපදේශ අංක 04 හි 6(ආ) ඡේදය ප්‍රකාරව කටයුතු කල යුතුය. |

### 4.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2008 අංක 06 දරන අපි වෙනුවෙන් අපි අරමුදල් පනතේ 11(6) වගන්තිය ප්‍රකාරව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන සහ විගණකාධිපති වාර්තා අරමුදල ආරම්භයේ සිට 2021 වර්ෂය දක්වා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරි ගිණුම් වර්ෂයේදි අරමුදලේ මූල්‍ය ප්‍රකාශන සහ විගණකාධිපති වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කරන බව දන්වමි. | 2008 අංක 06 දරන අපි වෙනුවෙන් අපි අරමුදල් පනතේ 11(6) වගන්තිය ප්‍රකාරව කටයුතු කල යුතුය. |